**Press Release**

# පුළුල් වගකීමක් සහිත සේවා ස්ථානයක්: ආබාධ සහිතව ජීවත්වන්නන්ට පුහුණුව ලබාදීම සඳහා Airtel සහ EFC අතර සුවිශේෂී සහයෝගීතාවයක්

- ආබාධ සහිතව ජීවත්වන්නන් වෙනුවෙන් වෘත්තීය පුහුණුවීම් ලබාදීමට EFC සමග අත්වැල් බැඳගත් පළමු Telco සමාගම බවට Airtel ආයතනය පත්වෙයි

**2019 ඔක්තෝබර් 07:** ශ්‍රී ලාංකීය තරුණ පරපුර සවිබලගැන්වීම උදෙසා ඉතා කැපවීමෙන් කටයුතු කරන සන්නාමයක් වශයෙන් ඉහළ කීර්තිනාමයක් හිමිකරගෙන සිටින Airtel සමාගම, ආබාධ සහිතව ජීවත්වන්නන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට ලංකා සේව්‍ය සම්මේලනය (EFC) සමග විශේෂ අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී.

සේව්‍ය සම්මේලනය වෙතින් මාස 6ක කාලයක් සඳහා පුහුණුව ලබාදීමට අර්ධ දෘශ්‍යාබාධිත තැනැත්තෙකු Airtel සමාගම විසින් සේවයට බඳවා ගනිමින් මෙම නියමු ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

"තාක්ෂණයේ දියුණුවීමත් සමග ආබාධ සහිතව ජීවත්වන්නන් වඩාත් සවිබලගැන්වීමට අගනා අවස්ථාවන් නිර්මාණය වෙනවා. ඒ වගේම ඔවුන් සතු හැකියාවන් උපරිම මට්ටමින් සමාජයේ ඉදිරි ගමන වෙනුවෙන් යෙදවීමට හැකියාව ලැබෙනවා." යනුවෙන් අදහස් දක්වා සිටියේ Airtel Lanka සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ජිනේෂ් හෙග්ඩේ මහතාය.

තවදුරටත් අදහස් දක්වමින් හෙග්ඩේ මහතා මෙසේද පවසා සිටියේය. "සේව්‍ය පක්ෂය වශයෙන් ආබාධ සහිතව ජීවත්වන්නන් මුහුණ දෙන ගැටළු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් සෙවීම අප සැමගේ වගකීමක්. ඔවුන්ට අවශ්‍ය ශක්තිය ලබාදීම හරහා ඔවුන්ට ශ්‍රම බලකායට ඇතුලත්වීමටත්, ආයතනික හා ව්‍යාපාර මූලිකාංගයන් පිළිබඳ අවබෝධයක් ලබාගැනීමටත් අනිකුත් පිරිස්වලට මෙන්ම ඔවුන්ටද සිය හැකියාවන් හඳුනාගැනීමට සහ වැඩි දියුණු කරගැනීමට වෘත්තීය මට්ටමින් සහයෝගය ලැබීමත් මෙවැනි පුහුණු අවස්ථා විශාල වශයෙන් උපකාරී වෙනවා. Airtel Lanka සමාගම විසින් EFC සමග සහයෝගීතාවයෙන් ගනු ලැබූ මෙම උත්සාහය ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ සමාගමක් විසින් සිදුකරන ලද මේ ආකාරයේ පළමු ව්‍යාපෘතිය වීම ගැන අප ඉතාමත් ආඩම්බරයට පත්වෙනවා වගේම එය අපට විශාල ගෞරවයක්."

ගිවිසුම්ගත වීම නිමාවීමත් සමග ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රායෝගික පුහුණුවක් සහිත මාස හයක පුහුණු වැඩසටහනක් Airtel සමාගම විසින් ආරම්භ කර තිබෙන අතර, වැඩි පිරිසකට ඊට සහභාගීවීමටත් Airtel සමාගමේ ව්‍යාපාර මොඩලයෙහි විවිධ පැතිකඩයන් පිළිබඳ දැනුවත්වීමට මෙන්ම පාරිභෝගික ජීවන රටාවන් පිළිබඳව දැනුම ලබාගැනීමටත් මෙයින් වැදගත් අවස්ථාවක් උදාවී ඇත. සේවා ස්ථානය තුළ පුළුල් විවිධාංගීකරණයක් පවත්වාගැනීම සඳහා Airtel සමාගම අනුගමනය කරන ක්‍රියාමාර්ගයන් මේ හරහා තවත් ශක්තිමත්වී තිබේ.

"ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමුඛ පෙළේ විදුලි සංදේශ සමාගමක් වන Airtel සමාගම සමග මෙවැනි සහයෝගීතාවයකට එළඹීමට ලැබීම අපට විශාල ගෞරවයක්. ආබාධ සහිතව ජීවත්වන තැනැත්තන්ගේ යහපත වෙනුවෙන් එම සමාගම විශිෂ්ට වෘත්තීය පුහුණුවක් ලබාදීමට කටයුතු කිරීම හරහා සේව්‍යයින්ගේ ජාලය තුළ ඔවුන්ගේ දායකත්වය ඉතාමත් වැදගත් මට්ටමක පවතිනවා. සේවායෝජකයින් විසින් මෙවැනි වැදගත් ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබුනත් ශ්‍රම බලකායට ඇතුලත්වීමට සහ ආර්ථික ස්වාධීනතාවය වැඩිදියුණු කරගැනීමට බාධාකාරී අවස්ථා තවදුරටත් මෙරට තුළ පවතිනවා. අනිකුත් ආයතනයන්ටත් විශිෂ්ට ආදර්ශයක් වෙමින් Airtel සමාගම සමග මෙවැනි සහයෝගීතාවයකට අප එළඹියේ එම සේවා ස්ථානයන් තුළද ආබාධ සහිතව ජීවත්වන්නන් වෙනුවෙන් වඩාත් සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමට අභිතාලමක් වෙමිනුයි." යනුවෙන් අදහස් දක්වා සිටියේ ලංකා සේව්‍ය සම්මේලනයේ අධ්‍යක්ෂ ජෙනරාල්/ප්‍රධාන විධායක නිලධාරී, කණිෂ්ක වීරසිංහ මහතාය.

විදුලි සංදේශ සේවා ක්ෂේත්‍රය තුළ අලෙවි සහ පාරිභෝගික හැසිරීම් රටා අවබෝධ කරගැනීමේ හැකියාව ලබා දෙමින් එම අංශයන් කෙරෙහි මූලික අවධානය යොමුකරමින් මෙම පුහුණුවීම් ක්‍රියාවට නංවනු ඇත. සමාගමේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම අනුව පුහුණුවීම් සඳහා සහභාගීවන්නන් සමාගමේ සේවයට බඳවාගැනීමට Airtel සමාගම අපේක්ෂාවෙන් සිටී.

'Alive, Inclusive and Respectful,'යන වටිනාකම් මූලික කරගනිමින් ක්‍රියාත්මක Airtel සමාගම, මෙම පුහුණු ව්‍යාපෘතිය හරහා ආයතනයක් විසින් සමාජයේ සෑම දෙනාටම සමාන අවස්ථා නිර්මාණය කරදිය යුත්තේ කෙසේද යන කාරණය පැහැදිලි කර දෙයි.

- **අවසානයි -**

**ඡායාරූපය** -

Airtel Lanka සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී ජිනේෂ් හෙග්ඩේ මහතා සහ EFC අධ්‍යක්ෂ කණිෂ්ක වීරසිංහ මහතා අතර ගිවිසුම අත්සන් තබන ලද අවස්ථාව.

**භාරති එයාර්ටෙල් ලංකා පිලිබඳව**

වර්ෂ 2009 ජනවාරි 12 වන දින ශ්‍රී ලංකාවේ මෙහයුම් ඇරඹූ භාරති එයාර්ටෙල් (එයාර්ටෙල් ලංකා ) පාරිභෝගිකයන් මිලියනයක් කරා ලඟා වී සිටින ශ්‍රී ලංකාවේ වේගවත්ම සන්නිවේදන ජාලය වේ.තම වාණිජ මෙහයුම් ඇරඹූ 2009 වර්ෂයේ සිට වසර 03 ක් වැනි කෙටි කාලයක් තුළ එයාර්ටෙල් ලංකාවේ සෑම ප්‍රදේශයක් කරාම ව්‍යාපත් වූ අතර අද වන විට මුළු දිවයිනම ආවරණය කරනු ලබයි.ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇති එයාර්ටෙල් ලංකා දුරකථන අන්තර්ජාල සේවාවන් සහ ආයතනික විසඳුම් ඇතුළු ඩිජිටල් ජංගම දුරකථන සේවාවන් රාශියක් පිරිනමයි.වැඩි විස්තර සඳහා " www.airtel.lk" වෙත පිවිසෙන්න.